යෙව්ගිනි පෙර්මියාක්

පළමු මාළුවා

දැනුම හා පිදුම ගෙන බබලන්න මිස ලොවේ
ඔබ දිනුවෙ දිවා කල් නිදියෙන්න හෙම නොවේ

~ සීයා

පළමු මාළුවා

යෙවිගිනි පෙරේමියාක්

පරිවර්තනය - මහින්ද සෙනරත් ගමගේ

ISBN 978-955-1319-10-6

© සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

සිතුවම - ගෙන්රික් වල්ක්

මුද්‍රණය - කැනොල් ප්‍රින්ට්

ප්‍රකාශනය - සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

අත් තියෙන්නෙ මොනවට ද?

පිටි හා එයාගෙ සීයා හොඳම හොඳ යාළුවෝ. ඒ දෙන්නා එකතුවෙලා හැම දේ ගැනම කථා කළා.

දවසක් සීයා මුණුපුරාගෙන් මෙහෙම ඇහැව්වා.

"මිනිස්සුන්ට අත් ඕනෑ වෙන්නේ මොකටද පිටි?"

"බෝල ගහන්න" පිටි උත්තර දුන්නා.

"එතකොට තව මොනවට ද?" සීයා ආයෙත් ඇහැව්වා.

"හැන්දක් අල්ලා ගන්න"

"එතකොට තව?"

"පූසාව අතගාන්න"

"එතකොට තව"

"ගල්කැට ගඟට විසි කරන්න"

මුළු හැන්දෑව පුරාම මේ විදිහට පිටි එයාගෙ සීයට උත්තර දුන්නා. ඒ උත්තර ඔක්කොම හරි. එකම වරද හැම දේම තීරණය කළේ තමන්ගේ අත්වලින් කෙරෙන දෙයින් වීමයි. එහෙම නැතුව අම්මගෙ හරි තාත්තගෙ හරි අත්වලින් කෙරෙන දෙයින් නොවීමයි. ඒ වගේම මුළු ලෝකයම නැවතීමක් නැතිව ඉදිරියට ගෙනියන, වෙහෙස මහන්සි වෙන අත්වලින් කෙරෙන දේවලින් එයා තීරණය නොකිරීමයි.

මාෂා ලොකු ළමයෙක් වුණා හැටි.

පුංචි මාෂාට ලොකු වෙනකම් බලාගෙන ඉන්න බෑ. ඒත් එයා දැනගෙන හිටියෙ නෑ ලොකු වෙන්න මොනව කරන්නද කියල. එයා හැමදේම කරල බැලුවා. අම්මාගෙ සපත්තු දාලා බැලුවා. අත්තම්මගෙ කබාය ඇඳලා වාඩිවෙලා බැලුවා. කේට් නැන්දා වගේ කොණ්ඩේ හදලා බැලුවා. පබළු මාලේ දාලා අත් ඔරලෝසුවක් බැඳලා බැලුවා.

ඒත් කිසිම දෙයක් වුණේ නෑ. අනිත් අය ඔක්කෝම එයාට හිනා වුණා විතරයි.

ඊට පස්සේ දවසක් මාෂා කල්පනා කළා බිම අතුගාන්න ඕනෑ කියලා. ඉතින් එයා එහෙම කළා. එයා කොච්චර හොඳට අතු ගෑවා ද කීවොත් අම්මාත් පුදුම වුණා.

"ඔයා හැබෑවටම ලොකු ළමයෙක් වෙමින් ඉන්නවා නොවැ."

ඊට පස්සෙ දවසක් මාෂා පිඟන් කෝප්ප ටික හේදුවා. ඒවා හැබෑවටම දිස්නය දෙන තරමටම එයා හෝදලා තිබුණා. ඊට පස්සෙ මාෂා ඒවා තෙත බිංදුවක් වත් නැති වෙන තරමට පිහි දැම්මා. ඒ වෙලාවෙ නම් අම්මා විතරක් නෙමෙයි තාත්තාත් පුදුම වුණා. තාත්තා කොච්චර පුදුම වුණා ද කියනවා නම් හැමෝටම ඇහෙන්න මෙහෙම කිව්වා.

"අපේ මාෂා මෙච්චර ලොකු වුණේ කොහොමද කියල අපි දැක්කෙවත් නෑ නොවැ. එයා බිම අතුගානවා විතරක් නෙවෙයි ඒ තරමටම හොඳට පිඟන් කෝප්ප හෝදනවා නේ."

දුන් හැමෝම පුංචි මාෂාට කතා කරන්නේ ලොකු දුව කියලායි. මාෂාටත් හිතෙන්නේ දැන් තමන් ලොකු ළමයෙක් කියලායි. ඒත් මාෂා තාමත් දන්නෙ එයාගෙ පරණ පුංචි සපත්තුමයි. අදින්නෙ පුංචි ගවුම් පොඩිමයි. ඒ වගේම කොණ්ඩ මෝස්තර දාන්නෙත් නෑ, පබළු මාල දාන්නෙත් නෑ. ඔරලෝසුවක් බඳින්නෙත් නෑ.

පැහැදිලිවම පේනවා මේ දේවල් නොවෙයි පුංචි අයව ලොකු අය කරන්නෙ කියල.

කඩි මුඩි පිහිය

ඩීමා හිටියෙ කෝටුවක් රහිමින්. ඒත් අන්තිමට එයා ඒක නවත්තලා දැම්මා. කෝටුව ඇදවෙලා, සමතලා නැති, කැත එකක් වුණා.

"ඇයි මොකද වැරැද්ද?" තාත්තා ඇහැව්වා.

"පිහිය හොඳ නෑ. ඒකෙන් රැහෙන්නේ ඇදේට." ඩීමා උත්තර දුන්නා.

"නෑ නෑ එහෙම නෙවෙයි. පිහියෙ වැරැද්දක් නෑ. ඕක වුණේ ඔයාගෙ කලබලේ හින්දා. මං ඔයාට ඕක කියා දෙන්නංකෝ ඉවසීමෙන් ඕක කරන හැටි."

"ඒ කොහොමද?"

"මෙන්න මෙහෙමයි"

තාත්තා කෝටුවක් අරගෙන බොහෝම පරිස්සමින්, හෙමින් ඒක රහින්න ගත්තා. ඩීමා දැනගත්තා කොහොමද පිහියට ඉවසීම උගන්වන්නේ කියල. ඉතිං කෝටුව අරගෙන තාත්තා වගේම පරිස්සමට හෙමින් ඒක රහින්න වුණා. හුඟ වෙලාවක් යන තුරුම කඩිමුඩි පිහිය එයාට කීකරු වුණේ නෑ. ඒක හැදුවේ හදිස්සි වෙන්නමයි. එහාට මෙහාට පනින්නමයි..... ඒත් ඩීමා ඒකට ඉඩ දුන්නේ නෑ. එයා පිහියට ඉවසීම ඉගැන්නුවා.

ඉතිං පිහිය හොඳට, සමානව, ලස්සනට ඒ වගේම කීකරුව රහින්න පටන් ගත්තා.

පළවෙනි මාළුවා

යූරිගේ ගෙදර ගොඩක් අය හිටියා. ඒ ඔක්කොම හරි සතුටින් ඉන්න අය. යූරි ඇරෙන්න හැම දෙනාම වැඩ කළා. යූරිට නාම අවුරුදු පහයි.

දවසක් යූරිගේ පවුලේ අය මාළු බාන්න ගියා. ඒ ගොල්ලො ලොකු මාළු තොගයක් අල්ලලා අත්තම්මට දුන්නා මාළු සුප් එකක් හදන්න. යූරිත් මාළුවෙක්ව ඇල්ලුවා. එයා ළඟටත් දුන්නා අත්තම්මාට සුප් එකට දාන්නට.

අත්තම්මා සුප් හැදුවා. කට්ටියම ගං ඉවුරේ සුප් හට්ටිය වටේ වාඩි වුණා. සුප් එක හරිම රසයි. කවුරුත් අත්තම්මාට ස්තුති කළා.

"අපේ සුප් එක මෙච්චර රස, යූරි අල්ලපු මාළුවා නින්දයි. යූරි ඇල්ලුවෙ ලොකු මාළුවෙක්. අනිත් මාළුන්ට වඩා ඒ මාළු ජාතිය රසයි. ඒ වගේම ගුණයි. සුප් එක ඒකෙන්ම තමා මෙච්චර රස වුණේ"

යූරි පුංචි දරුවෙක් වුණත් එයාට තේරුණා ලොකු අය කරන්නේ විහිළුවක් බව. පුංචි මාළුවෙක් කොහොමද සුප් එකක් රස කරන්නේ. එහෙම වුණත් එයා හිටියෙ සතුටින් ඒ මාළුව පුංචිම පුංචි එකෙක් වුණත් මේ ලොකු පවුලේ සුප් එකට එකතු වෙලා තිබුණ හින්දයි.

කවුද පළවෙනියා?

පුංචි ගෑනු ළමයි තුන් දෙනෙක් වාදෙක පැටලිලා. පාසලට ගියාම ඉහළින්ම ඉන්නේ කවුද කියලායි ඒගොල්ලො වාද කළේ.

"මම තමයි ඉහළම වෙන්නේ. මොකද මගේ අම්මා මට දැනටමත් බෑග් එකක් ගෙනල්ලා තියෙන්නේ" ලුසි කීවා.

"නෑ නෑ මමයි. මගේ අම්මා මට ඉස්කෝලේ යන්න ඇඳුමක් මහල තියෙන්නෙ ඒප්‍රණයකුත් එක්ක." කේට් කීවා.

"අපොයි නෑ. මමයි ඉහළම වෙන්නේ. මට බෑග් එකකුයි, පැන්සල් පෙට්ටියකුයි, ඒප්‍රන් එකක් තියෙන ඇඳුමකුයි විතරක් නෙවෙයි, කොණ්ඩ කරල් බඳින්න පීත්ත පටි දෙකකුත් අම්මා ගෙනත් දීලායි තියෙන්නෙ" ලේනා යෙහෙළියන් එක්ක වාද කළා.

පුංචි ගෑනු ළමයි තුන් දෙනා උගුර බැරැඬි වෙන තුරාම වාද කළා. අන්තිමේ මේ අය ඒ ගොල්ලන්ගෙ යෙහෙළිය මාෂා සෝයාගෙන ගියා. කවුද ඉහළින්ම ඉන්නෙ කියලා ඈ තීරණය කළාවේ.

යෙහෙළියෝ තුන් දෙනා මාෂාව සොයා ගත්තා. එයා හිටියෙ හෝඩි පොත පාඩම් කරමින්.

"අනේ මං දන්නෙ නෑ කවුරු ඉහළින් ඉඳීවිද කියල" මාෂා උත්තර දුන්නා. "මට ඕවට වෙලාවක් නෑ. මට තව අකුරු තුනක් ඉගෙන ගන්න තියෙනවා"

"ඒ මොකටදැයි?" යෙහෙළියො ඇහුවා.

"පන්තියෙ පහළම කෙනා වෙන්නෙ නැති වෙන්න" මාෂා එහෙම කියල ආයෙත් පොත කියවන්න ගුණා.

ලුසියි, කේටියි, ලේනායි හිටියෙ කිසිම සද්දයක් නැතුව. කවුරු ඉහළින් ඉඳීවිද කියල වාද කරන්න ඒ, ඇක් තිබුණෙ නෑ. ඒක හොඳටම පැහැදිලියි.

පිල්

පිල් පුරුදු වෙලා හිටියෙ තමන්ට හැම දේම කරන්න පුළුවනි කියල, තමන් හැමදේම කරන හැටි දන්නවා කියල පුරසාරම් කියන්නයි.

එයාට දවසක් තණකොළ කපන්න යන්න සිද්ධ වුණා. ඉතිං පිල් මුළු දවස තිස්සෙම තණකොළ කැපුවා. ඒත් හරියකට තණකොළ කපල ඉවර කරගන්න එයාට බැරි වුණා. නිකම් කාලෙ නාස්ති කළා විතරයි.

"ඔයාට මක්වෙලාද පිල්?"

"මේ දෑකැත්ත මොට්ටයි. එක සැරේකට මේක පොළොවෙ වදිනවා. අනිත් සැරේ ලිස්සලා තණකොළ ටික උඩින් යනවා. මං ගිහිං එළදෙනුන්ට තණකොළ කවන එක තමා වැඩිය හොඳ"

ඉතිං පිල් එළදෙනුන්ට තණකොළ කවන්න ගෙනාවා. උන් ටික හැම තැනම විසිරිලා ගියා. උන්ව එකට එකතු කරගන්න හුගාක් වෙලා ගියා.

"මොකද වුණේ පිල්?"

"මොකවත් නෑ. ඒක මේ එළදෙනුන්ගේ අයිතිකාරයාගේ වැරැද්ද. ඒ අය එළදෙනුන්ගෙ කකුල් බැඳල නෑ. උන්ව එහෙම බැඳල නැති කොට මං කොහොමද උන්ට තණකොළ කවන්නේ? උන් ඕනෑ පරණ පාරක් දිගේ ඉබාගාතෙ යනවා. වැඩිය හොඳ මං හිතන්නෙ ඔරුව පදින එක."

පිල් ඔරුව පදින්න ගත්තා. එයාට ඒක කෙළින් පැදගන්න බැරි වුණා. අන්තිමේ ඔරුව වැලි කන්දක හිර වුණා.

"මොකද වුණේ පිල්?"

"මට කුසද්ඳයක් දිල නෑනෙ?"

"මොන කුසද්ඳයක්ද?"

"සුක්කානම එයා මෙහා හැරෙන්නෙ නැති වෙන්න ගහන කුසද්ඳයක්. එහෙම එකක් ගැහැව්ව නම් ඔරුව කෙළින්ම යනවා. මේක හරියන්නෙ නෑ. වැඩිය හොඳයි මම ගිහින් වයලින් එක ගහන එක"

පිල් වයලීනය වාදනය කරන්න ගත්තා. ගම පුරාම හිටිය බල්ලො උඩු බුරලන්න වුණා. අටු උඩ ලැගලා හිටිය බළල්ලු මරහඬ තලන්න වුණා. මිනිස්සු පාරට දුවගෙන ආවා.

"මොකද පිල් දිගටම මේ විදියට කරන්නෙ? ඇයි නුඹ හැමදේම කරන්න දන්නවා කියල බොරු පුරසාරම් කියවන්නෙ?"

"ඒත් ඔයාලට පේනවනේ මට ඕන කරන හැම දෙයක්ම කරන්න පුළුවනි. ඒත් මගේ අත් තමා මට කිකරු නැත්තෙ. මේ හැමදේටම වැරදිකාරයා අත්දෙක මිසක් මං නෙවෙයි."

ආයෙ සැරයක් පිල් තමන්ට පුරුදු විදිහට කතා කිය කිය ගියා. ඒවා ඇත්ත වගෙයි පෙනුනෙ. ඒත් එදා ඉඳලා කිසිම කෙනෙක් කයිවාරුකාරයාගෙ කිසිම වැඩක් ගැන විශ්වාසයක් තිබ්බෙ නෑ.

කුරුල්ලන්ට ගෙවල්

වාස්යාටයි, වාන්යාටයි අවුරුදු හතක් වෙන කාලෙදිම ඒ දෙන්නා කල්පනා කරල තිබුණා ගොඩනැගිලි ඉදිකරන්නො දෙන්නෙක් වෙන්න. ඒ ගොල්ලන්ට ඕනෑ වුණේ ලොකු ගෙවල් හදන්නයි. ඒත් ඒකට හුගක් කාලේ ගත වෙනවා. ඉතිං දෙන්නට දැනට ඕනෑ වුණා මොනවා හරි දෙයක් හදන්න.

ඒ හින්දා දෙන්නා කල්පනා කළා පුංචි ගෙවල් හදලා වැඩේ පටන් ගන්න. ඒ කියන්නේ කුරුල්ලන්ට ගෙවල් හදල දෙන්න.

කුරුල්ලන්ට ගෙයක් හදන එක බොහෝම සරල දෙයක් වගෙයි පේන්නේ. ඒත් ඒක කොහෙත්ම සරල වැඩක් නෙවෙයි. ගිය අවුරුද්දෙ ළමයි කුරුළු ගෙවල් හුගක් හැදුවා. ඒත් කුරුල්ලො ඒවායෙ පදිංචි වුණේ නෑ. ඒවා හැම නැනින්ම පුපුරල. ඒ මදිවට ගේ ඇතුළෙන් ඇණ මතුවෙලා. කුරුල්ලෝ හැම පුංචි දේ ගැනම හොයා බලනවා. උන් මොනම පරණ ගෙයකවත් පදිංචි වෙන්නේ නෑ.

වාස්යායි, වාන්යායි මේක තේරුම් ගත්තා. ඒ දෙන්නා ලෑලි අරගෙන හොඳට, සිනිඳුවට හිටින්න යතු ගෑවා. ඊට පස්සෙ එක පිපිරුමක්වත් නැතිවෙන්න තදට ඇණ ගැහැව්වා. ඒ වගේම දෙන්නා පරිස්සම් වුණා, ඇණ ඇතුළෙන් මතු නොවෙන්න වග බලා ගන්න.

එක සැරේටම බලාගන්න පුළුවනි. මේ ළමයි දෙන්නා දවසක හොඳ ගොඩනැගිලි ඉදිකරන්නන් වෙනවා කියලා. ඒ වගේම ඒ අය හදන ගෙවල් ඒ ගොල්ලො හැදුව කුරුළු ගෙවල් වගේම ස්ථිර, සැප පහසු ඒවා වේවි.

අම්මා රවටන්නට මයික්ට ඕනෑ වූ හැටි

මයික්ගේ අම්මා වැඩ ඇරිල ගෙදර ආවා. ඒ ආ හැටියෙම ඈ පුදුමයෙන් ගල් ගැසුණා.

"මොන ඇන්නෑවකින්ද ඔයා ඔය බයිසිකලේ රෝදයක් කඩා ගත්තෙ?"

"ඒක ඉබේම කැඩුණා අම්මේ"

"එතකොට ඔය කමිසෙ ඉරුණේ?"

"ඒක ඉබේටම ඉරුණා අම්මේ?"

"එහෙනම් කොහේද ඔයාගෙ අනිත් සපත්තුව අතුරුදහන් වුණේ? කොහේද ඔයා ඒක නැතිකර ගත්තෙ?"

"ඒක ඉබේම කොහේදෝ නැතිවෙලා අම්මේ"

ඊට පස්සෙ අම්මා මෙහෙම කිව්වා.

"මේ බඩු ජාති මොන තරං නං බයංකාරද ඈ? මේ භයානක බඩුවලට හොඳ පාඩමක් උගන්නන්න ඕනෑ"

"ඒ කොහොමද?"

"ඒක හරි ලේසියි. ඒවා දන්නවා නං ඉබේම කැඩෙන හැටි, ඉබේම ඉරෙන හැටි, ඉබේම නැතිවෙන හැටි, අපි ඉඩ දෙමු ඒවාට තනියම ආපහු හැදෙන්න, තනියම ආපහු මැහෙන්න, තනියම ආපහු නැතිවුණ තැනින් හොයා ගැනෙන්න. ඔයයි මායි දෙන්නා ඒවා එහෙම කරගන්නකං වාඩිවෙලා බලා ඉඳිමු"

ඉරුණු කමිසය පිටින්, එක කකුලක සපත්තු නැතිව මයික් තමන්ගේ කැඩුණු බයිසිකලේ ළඟට වෙලා කල්පනා කරන්නට පුරුදා.

සාර්ථක මාළු කාරයා

මාළු බාන්නෝ තුන්දෙනෙක් ගඟේ මාළු බානවා. ඒත් තුන්දෙනා මුළු උදේ වරුවෙම එකම මාළුවෙක්වත් ඇල්ලුවේ නැති තරමයි. ඒත් ඒ කිට්ටුවම තැනක ඉඳගෙන වයසක් නැති පුංචි හාදයෙක් එකෙකුට පස්සෙ එකෙක් ගානෙ මාළු අල්ලනවා. උදේ වරුවට එයා මාළු දුසිම් පහක් නැත්නම් හයක් ඇල්ලුවා.

ලොකු මාළු බාන්නෝ තුන්දෙනා මෙහෙම ඇහැව්වා.

"කොහොමද ළමයා ඔච්චර හොඳට මාළු බාන්නෙ"

"අපිට අහුවෙන්නෙ නැනෙ ඔහොම? නුඹට හොඳ මාළු අහිනක් අහුවෙලාවත්ද?"

"අපොයි නෑ. මට ඕනෑ තැනකින් මේ වගේ මාළු අල්ලන්න පුළුවනි."

එහෙම කියලා පුංචි හාදයා නූලක් ඇදලා ගත්තා. නූල කෙළවර වීදුරු බෝතලයක් බැඳල තිබුණා. බෝතලේ වතුර පිරිලා. වතුරත් එක්කම හීනි රතුපාට පණුවො ගොඩක්.

"බෝතලේ වතුර යටට ගිල්ලලා තිබ්බම මාළුන්ට පණුවන් පේනවා. ඒත් මාළුවන්ට පණුවො කන්න බෑ. ඉතිං උන් බෝතලේ වටේ රංවු ගැහෙනවා. එතකොට මම බිලී කොක්ක අමුණාපු යොත ඒ කිට්ටුවෙන් දානවා. උන් ඒක කෙළින්ම ලෑටි ගාන්න ගන්නවා." පුංචි හාදයා කොක් හඬ ලෑවා.

"හ්ම්.. නුඹ නම් හරිම කපටියෙක්" එහෙම හිතුව වැඩිමහළු මාළු බාන්නෝ තුන්දෙනා බාලයාගෙ පොතෙන් පාඩමක් ඉගෙන ගන්න කල්පනා කළා.

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂින් හවුස් (පුද්) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 978-955-1319-10-6

මිල රු. 150/-